ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජූලි 2011

## (52) ආර්ථික විද්‍යාව
(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට අයදුම්කරුවන් පිළිතුරු දී තිබූ ආකාරය තුළින් සතුටුදායක සාධන මට්ටමක් පෙන්නුම් කළද ඇතැම්විට ඔවුන්ගේ පිළිතුරු ලිවීමේ ප්‍රවනතාව තරමක පසුබෑමක් දක්නට ලැබුණි. එසේ වීමට හේතු වශයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයට ලක්වූ ඇතැම් දුර්වලතා පහත දැක්වේ.

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**

(ලකුණු 02 බැගින් බහුවරණ ප්‍රශ්න 20) (අනිවාර්ය ප්‍රශ්නයකි.)

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ සමස්ථ විෂය නිර්දේශය සහ ප්‍රායෝගික දැනුම ආවරණය වන ආකාරයට වේ. අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. මෙම ප්‍රශ්න 20 සඳහා පිළිතුරු සැපයීමේ හැකියාව අයදුම්කරුවන්ගේ නියැදියක් අහඹු ලෙස තෝරාගැනීමෙන් විමසන ලදී. ඒ අනුව ප්‍රශ්න අංක (E), (G), (H), (K), (L), (S) සහ (T) යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණය යටතේ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

**(E) ප්‍රශ්නය සඳහා**

හරස් ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳව න්‍යායාත්මක දැනුම වඩාත් පුළුල්ව දැනුවත් විය යුතු බව.

**(G) ප්‍රශ්නය සඳහා**

උපේක්ෂා වක්‍ර පිළිබඳව නිවැරදි අවබෝධයක් නොතිබූ බව සහ එම වක්‍ර ගමන් කරන ආකාරය පිළිබඳව පැවති අනවබෝධය.

**(H) ප්‍රශ්නය සඳහා**

මෙහි දක්නට ලැබුනු "අසත්‍ය ප්‍රකාශය" යන්න පිළිබඳව සැලකිලිමත් නොවීම.

**(K) ප්‍රශ්නය සඳහා**

ජාතික ආදායම ගිණුම් ගත කිරීමේදී අදාල සංකල්ප පිළිබඳව තිබූ අනවබෝධය.

**(L) ප්‍රශ්නය සඳහා**

රාජ්‍ය අයවැය ලේඛනය සම්බන්ධව "සංක්‍රාම ගෙවීම්" යටතේ රජයේ කාර්යභාරය පිළිබඳව දැනුවත් විය යුතු බව.

**(S) ප්‍රශ්නය සඳහා**

"බඳු අනුකූලතාව" යන පදය පිළිබඳ දැනුවත් බව අඩු බව. රාජ්‍ය මූල්‍ය පිළිබඳව ඇති මූලධර්ම ගැන අවබෝධය අඩු බව.

**(T) ප්‍රශ්නය සඳහා**

අයවැය හිඟය මූල්‍යනය කිරීමේ උපකරණ පිළිබඳව දැනුවත් විය යුතු බව. විශේෂයෙන් ප්‍රසාරණාත්මක හා ප්‍රසාරණාත්මක නොවන අංශ පිළිබඳ අවබෝධයක් තිබිය යුතු බව.

# B කොටස

මෙම කොටස ප්‍රශ්න 6 කින් සමන්විත වූ අතර එයින් අයදුම්කරුවන් කැමති ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයීමේ අවස්ථාව ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** (i) ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නය වන "හිඟකම" පිළිබඳව නිර්වචනාත්මක දැනුම පිරික්සීම මෙයින් අපේක්ෂිතයි. අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුනද පහත සඳහන් අඩුපාඩු දක්නට ලැබුණි.

(1) අවශ්‍යතා හා වුවමනා යන සංකල්ප පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොතිබීම.

(2) අවශ්‍යතාවලට සාපේක්ෂව භාණ්ඩ හිඟබව.

(3) නිෂ්පාදන සාධක ඉල්ලුමට අනුව සැපයුම හිඟකම බව.

(ii) හිඟකම හා තේරීම අතර වෙනස්කම් පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය මැනීම බලාපොරොත්තු වී ඇත. එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් වැඩි දෙනෙක් ප්‍රශ්නයට අදාලව කරුණු ගොනුකරලීමේ අපහසුතාවයක් දක්නට ලැබුණි.

එයට හේතු වශයෙන්:

(1) හිඟකම හා තේරීම වචනාර්ථයෙන් පැහැදිලි කිරීම.
උදා:- තේරීම පෞද්ගලිකයි. හිඟකම පොදුයි.

(2) තේරීම හා සම්බන්ධ විකල්ප ප්‍රයෝජන පිළිබඳව අවබෝධයක් නොමැති වීම.

(3) තේරීම ආවස්ථික පිරිවැය ලෙස දැක්වීම.

**(b)** මෙම කොටසින් මූලික ආර්ථික ගැටළු පිළිබඳ මූලික දැනුම පිරික්සීම අපේක්ෂිතයි. ඉතා සරල ප්‍රශ්නයක් වුවද අයදුම්කරුවන් පිළිතුරු ඉදිරිපත් කිරීමේදී එතරම් සාර්ථක බවක් දක්නට නොලැබුණි.

පිළිතුරු වල දක්නට ලැබුණු අඩුපාඩු වශයෙන්:

(1) විරැකියාව, උද්ධමනය, ඌන සංවර්ධනය, දේශපාලනය හා සිවිල් අරගල ආදිය මූලික ආර්ථික ප්‍රශ්න ලෙස දක්වා තිබීම.

(2) කුමක්, කොපමණ ප්‍රමාණයක් නිපදවිය යුතුද යන්න සම්පත් බෙදාහැරීම පිළිබඳව පවතින ගැටළුවක් බව අනවබෝධයෙන් ලියා දැක්වීම.

(3) "විශේෂයෙන් කා සඳහාද" යන්න සාධක ආදායම් බෙදී යාම පිළිබඳ සංකල්පය යන්න අවබෝධය අල්ප වීම.

**(c)** මෙම කොටසින් මූලික ආර්ථික ප්‍රශ්න වෙළෙඳපොල ආර්ථික ක්‍රමයක විසඳන්නේ කෙසේද යන්න පුළුල් ලෙස පිරික්සීමක් කර ඇත. අයදුම්කරුවන් වැඩිදෙනෙක් මෙම කොටසට අසාර්ථක පිළිතුරු සපයා තිබුණි.

එයට හේතු වශයෙන්:

(1) මිල ක්‍රමය හෝ මිල යාන්ත්‍රණය ලියා තිබුණද ඊට අදාල අනෙකුත් කරුණු වන ස්වාර්ථය මත පදනම් වීම, පිරිවැය අවම වීම, ක්‍රය ශක්තිය ආදිය පිළිබඳව කරුණු ඉදිරිපත් නොකිරීම.

(2) දිගින් දිගටම මිල යාන්ත්‍රණය ගැන අනවශ්‍ය ලෙස විස්තර කිරීම.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) පූර්ණ තරඟයක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පිළිබඳව මූලික දැනුම හා අවබෝධය මැනීම අපේක්ෂිතයි. පහසු සරල ප්‍රශ්නයක් වුවත් අයදුම්කරුවන්ගෙන් සමහරක් අසාර්ථක පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

එයට හේතු වූයේ:

1. විකුණුම්කරුවන් හා ගැනුම්කරුවන් රාශියක් සිටීම ලක්ෂණ දෙකක් ලෙස දැක්වීම.
2. නිෂ්ප්‍රමාණික ලාභ හා ප්‍රමාණික ලාභ ලැබීම පිළිබඳව නිවැරදිව නොදැක්වීම.
3. ප්‍රචාරණයක් පවතින බව දැක්වීම.

(b) පූර්ණ තරඟකාරී ආයතනයක දිගුකාලීන සමතුලිතතාව පිළිබඳව දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වේ. පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන දුර්වලතා දක්නට ලැබුණි.

1. දිගුකාලීන සමතුලිතතාව කෙටියෙන් පැහැදිලි කිරීම නිර්වචනාත්මක නොවීම.
2. දිගු කාලයේදී හා කෙටි කාලයේදී පූර්ණ තරඟකාරී ආයතනයක් ලබන ලාභ නිෂ්ප්‍රමාණික හෝ ප්‍රමාණික ලාභද යන්න නිශ්චිත අවබෝධයක් නොවීම.
3. ප්‍රස්තාරය නිවැරදිව ඇඳීමට නොහැකි බව.

උදා:




(c) (i) කතිපයාධිකාරය නිර්වචනය කිරීමේ හැකියාව මැනීම මෙයින් අපේක්ෂිතයි. අයදුම්කරුවන් වැඩි පිරිසක් නිවැරදිව ලියා තිබූ පිළිතුරකි.

(ii) කතිපයාධිකාරයේ ලක්ෂණ පිළිබඳව සාර්ථකව පිළිතුරු සපයා වැඩි ලකුණු ලබාගෙන තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් පිළිතුරු සැපයීමේදී පහත සඳහන් කරුණුද ලක්ෂණ ලෙස ලියා තිබුණි.

උදා: ඇඩ් වෛරයක්, කුලල් කෑමක් වැනි ආර්ථික විද්‍යා සිද්ධාන්ත වලට අනුකූල නොවන වචන යෙදීම.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** "හීනවන ආන්තික උපයෝගිතාවය" නිර්වචනය කර එය සංඛ්‍යාත්මකව උදාහරණයක් මගින් ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීමට බලාපොරොත්තු වී ඇත. මෙම ප්‍රශ්නය බොහෝ අයදුම්කරුවන් තෝරා ගෙන තිබුණද එයට සාර්ථක පිළිතුරු සපයා නොතිබුණි.

එයට හේතු වශයෙන්:

1. හීනවන ආන්තික උපයෝගිතාවය වෙනුවට ආන්තික උපයෝගිතාවය විස්තර කිරීම.
2. නිෂ්පාදනය දිගටම කරගෙන යනවිට තෘප්තිය අඩුවීම ලෙස හැඳින්වීම.
3. භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී හීනවන ආන්තික උපයෝගිතාවය ඇතිවන බව.
4. සංඛ්‍යාත්මක උදාහරණය ඉදිරිපත් කිරීමේදී සතියක් තිස්සේ භාණ්ඩ වර්ගයක් දිගින් දිගටම පරිභෝජනය කිරීමේදී තෘප්තිය අඩු වන බව දැක්වීම.
5. භාණ්ඩ දෙකක් පරිභෝජනය කිරීමේදී එක් භාණ්ඩයකට සාපේක්ෂව අනෙක් භාණ්ඩයේ තෘප්තිය අඩුවන ලෙසට සංඛ්‍යාත්මක සටහන සකස් කිරීම.

**(b)** ආන්තික උපයෝගිතා න්‍යායෙහි අවාසි පිළිබඳව අයදුම්කරුවන් ලියන ලද පිළිතුරු එතරම් සාර්ථක නොවිණ. බොහෝ දෙනෙක් "මෙම න්‍යාය ප්‍රායෝගික නොවේ" ලෙස දක්වා තිබුණි. අඩු ලකුණු ලබාගත් ප්‍රශ්නයකි.

**(c)** ඉල්ලුම තීරණය කරන සාධක පිළිබඳ දැනුම විමසීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිත විය. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු සපයා තිබූ අතර එයට හිමි උපරිම ලකුණු ලබා ගන්නා ලදී. එහෙත් සමහර අයදුම්කරුවන් $P_x$ , $P_n$ - 1, $Q_x$ ආදී සංකේත භාවිත කර තිබුණ නිසා පිළිතුරු අපැහැදිලි විය.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** සංවෘත ආර්ථිකයක වෘත්ත ප්‍රවාහ සටහනක් න්‍යායාත්මක සංකල්ප අනුව යෙදීමේ හැකියාව මැනීම මෙම කොටසින් අපේක්ෂිත විය. සරල, කෙටි කාලයකින් ලිවිය හැකි ප්‍රශ්නයක් වුවත් න්‍යායාත්මක සංකල්ප පිළිබඳ අනවබෝධය නිසා අයදුම්කරුවන්ගෙන් සමහරෙක් අඩු ලකුණු ලබා ගන්නා ලදී. එයට හේතු වශයෙන් මූල්‍ය හා මූර්ත ප්‍රවාහයන් ගලායන දිසාව පිළිබඳව දැනුවත් නොවීම විය හැකිය.

**(b)** මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් විය.

**(c)** දළ ජාතික නිෂ්පාදිතය සාධක පිරිවැය මිලට ගණනය කිරීම පිළිබඳ අවබෝධය ඉතා අල්ප විය. එහෙත් නිවැරදිව ගණනය කළ අයදුම්කරුවන් පියවරින් පියවරට හිමි ලකුණු සියල්ලම ලබා ගැනීමට සමත් විය.

එහි අඩුපාඩු වශයෙන්:

1. ප්‍රාග්ධන පරිභෝජනය ක්ෂයවීම් ලෙස වටහා නොගැනීම.
2. ජාතික ආදායම තක්සේරු කිරීමේදී වැරදි සංකල්ප යොදා ගැනීම.

## ප්‍රශ්න අංක **06** - ලකුණු 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** පුළුල් මුදල් සැපයුම පිළිබඳ සංරචකවල දැනුම අවබෝධය මැනීම අපේක්ෂිතයි. බහුතරයක් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබුණද පහත සඳහන් අඩුපාඩු දක්නට ලැබුණි.

1. සංරචක දැක්වීමේදී "මහජනයා සතු" යන්න නොදැක්වීම.
2. පුළුල් මුදල් සැපයුම $M_1$ ලෙස දැක්වීම.

**(b)** (i) ඉතා සරල දැනුම මැනීමේ ප්‍රශ්නයකි. සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් අයදුම්කරුවන්ගෙන් සමහරෙක් මුදලේ වටිනාකම සරලව පැහැදිලි කිරීම වෙනුවට ගැඹුරින් විස්තර කිරීමෙන් අනවශ්‍ය කරුණු ලියා දැක්වීම විශේෂතාවයක් විය .

උදා:- 1. මුදලේ අභ්‍යන්තර හා බාහිර අගය පිළිබඳව කරුණු දැක්වීම.

2. ශ්‍රී ලංකා රුපියල, ඇමෙරිකානු ඩොලරය හා සංසන්දනය කර මුදලේ වටිනාකම පැහැදිලි කිරීම.

(ii) මෙහිදී සාමාන්‍ය මිල මට්ටම හා මුදලෙහි වටිනාකම අතර සම්බන්ධතාවය දැක්වීම අපේක්ෂා කෙරේ. බොහෝ පිළිතුරුවල සම්බන්ධය දැක්වීම වෙනුවට සංකල්ප වෙන වෙනම අර්ථ දක්වා තිබුණි. එසේම මිල මට්ටම හා මුදලේ වටිනාකම අතර අනුලෝම සම්බන්ධතාවයක් ඇති බව සඳහන් කර තිබුණි.

එනම්:

(1) මිල මට්ටම ඉහළ යනවිට මුදලේ වටිනාකම ඉහළ යාම.

(2) මිල මට්ටම පහළ යනවිට මුදලේ වටිනාකම පහළ යන බව.

ඒ අනුව සංකල්ප අතර වෙනස්කම් පිළිබඳව නිවැරදි දැක්මක් නොමැති බව පෙන්නුම් කරන ලදී.

**(c)** උද්ධමනයේ ප්‍රතිඵල නිවැරදිව දැක්වීම බොහෝ අයදුම්කරුවන්ගේ පිළිතුරු වල දක්නට ලැබුණි. ඒ සඳහා වැඩි ලකුණු ලබා ගැනීමට ඉඩ සැලසිණි.

## ප්‍රශ්න අංක **07** - ලකුණු 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ සංකල්ප පිළිබඳව න්‍යායාත්මක දැනුම පිරික්සීමයි. යම් මට්ටමක සාර්ථක පිළිතුරු සපයා තිබුණද පහත සඳහන් දුර්වලතා දක්නට ලැබුණි.

1. ආර්ථික සංවර්ධනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක දියුණුවේ එකතුවක් ලෙස අවබෝධයක් නොමැති වීම.
2. ආර්ථික වර්ධනය ඉබේ ඇතිවන දෙයක් ලෙසත් සංවර්ධනය රජය මැදිහත් වී ක්‍රියාත්මක විය යුතු බවත් දක්වා තිබීම.

**(b)** මෙම කොටසට අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ඒ නිසා වැඩි ලකුණු ප්‍රමාණයක් හිමිකර ගැනීමට ඔවුන්ට හැකි විය.

**(c)** ආර්ථික විද්‍යා සංකල්ප වලට අනුගතව ප්‍රායෝගිකව ආර්ථික ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව මැනීම මෙයින් අපේක්ෂිත වේ. බොහෝ දුරට සාර්ථක පිළිතුරු දක්නට ලැබුණු අතර පහත සඳහන් දුර්වලතාද විය.

1. එළවළු සැපයුම ඉහළයාම මිලට බලපාන ආකාරය නොදැක්වීම.
2. එළවළු වල ඉල්ලුම ඉහළ යාම සහ පහළයාම මිලට බලපාන ආකාරය නොදැක්වීම.

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. සම්පූර්ණ විෂය නිර්දේශය මනාව හොඳින් අධ්‍යයනය කර තිබීම.
2. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පිළිපැදීම.
3. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීම.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයට පැහැදිලිව ඉදිරිපත් කිරීම.
5. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සහරා මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
6. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.
7. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
8. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති දේට පමණක් පිළිතුරු ලිවීම.
9. පිළිතුරු ලිවීමේදී න්‍යාය, සංකල්ප විධිමත්ව ඉදිරිපත් කිරීම, අවශ්‍යතැන්හි උදාහරණ මගින් ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීම වැදගත් වේ.
10. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම
11. අනවශ්‍ය විස්තර ලිවීමෙන් වැලකීම.
12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -